# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2413/40 - 2024 දෙසැම්බර් මස 04 වැනි බදාදා - 2024.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය* : DSM/YT/LAND/5/65.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/24/2022/HA/09.

පමුණුව ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ අංක E 399, පමුණුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පමුණුව ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 310420 හි කැබලි අංක ලෙස 01 සඳහන් වැදියක්පිටිය හේන, හපුගහමුල පිටිය, වෙදකාර ගෙදර පහළ වත්ත නමැති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්. 0.0153 ක් වූ බිම් කොටස.

01. **කැබලි අංකය 01**

ඉඩමේ නම : වැදියක්පිටිය හේන, හපුගහමුල පිටිය, වෙදකාර ගෙදර පහළ වත්ත; විස්තරය : පමුණුව ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම; හිමිකම් කියන අය : 1. කෝණාර මුදියන්සේලාගේ තිස්ස පමුණුව, 2. කෝණාර මුදියන්සේලාගේ ඉන්ද්‍රවංශ පමුණුව, 3. කෝණාර මුදියන්සේලාගේ ස්වර්ණා පමුණුව, 4. කෝණාර මුදියන්සේලාගේ අශෝක පමුණුව, වාලවෙල, පමුණුව; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0153.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ජනවාරි මස 20 වැනි දින පෙ.ව. 10.00 ට යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2024 දෙසැම්බර් මස 30 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. එම්. එම්. සී. පී. හිඳගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0044

## ශුද්ධි පත්‍රිකාව

### **1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIK/LAN/02/34.

අංක 2030/32 හා 2017.08.02 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 7 වැනි වගන්තිය යටතේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* මු.පි.මාර 2692 කැබලි අංක 120 දරන හීරළුදෙණිය සහ දන්ගහඉරිකොන්ද නැමැති කැබැල්ලෙහි ප්‍රමාණය හෙක්ටයාර් 0.0607 ක් වශයෙන් එම *ගැසට් පත්‍රයෙහි* සඳහන් වී ඇත. එම ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.0604 ක් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මධුමතී එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2024 දෙසැම්බර් මස 03 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0045

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.